# ප්‍රගති වාර්තාව - 2011

## 1.0 හැඳින්වීම

1985 අංක 28 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනයට මෙරට සාමාන්‍ය අධ්‍යාපන සහ ගුරු අධ්‍යාපන විෂයමාලා සැකසීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි වෘත්තිකයන්ගේ වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පර්යේෂණ පැවැත්වීමේ වගකීම පැවරී ඇති අතර ඒ අනුව 2011 වර්ෂයේ දී ආයතනය මගින් ව්‍යාපෘති 120ක් ක්‍රියාවට නඟන ලදී. මෙම වර්ෂයේ ආයතනයට ලබා දුන් රාජ්‍ය ප්‍රතිපාදන එහි සේවක වැටුප් සඳහා ප්‍රධාන වශයෙන් යොදාගත් අතර ඉතිරිය නඩත්තු කටයුතු වල කොටසක් සහ වාර්ෂික ව්‍යාපෘති වලින් සීමිත කොටසක් ක්‍රියාවට නැගීම සඳහා භාවිත කරන ලදී. ව්‍යාපෘති ආශ්‍රිත වියදම් ප්‍රධාන වශයෙන් පියවාගනු ලැබුයේ ලෝක බැංකු, යුනිසෙෆ් හා ජර්මන් සහයෝගිතා ආදි විදේශාධාර සපයන ආයතන මගින් ලැබෙන ප්‍රතිපාදන සහ අධ්‍යාපන පද්ධතියේ සිටින වෘත්තිකයන් සඳහා ආයතනය මගින් පවත්වනු ලබන සහතික පත්‍ර පාඨමාලාවන්ගේ සිට අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලා දක්වා වූ පාඨමාලා ඇතුළු අනෙකුත් ආදායම් මාර්ග ඔස්සේ උපයන ආදායම්වලින් කොටසකිනි.

වර්ෂය ආරම්භයේ දී ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ජාතික අධ්‍යාපන ආයතනයෙහි ආයතන සභාවට විවිධ නිපුණතා සහිත විශේෂඥ වෘත්තිකයන් ගෙන් සමන්විත නව සාමාජික මඩුල්ලක් පත් කරන ලදී. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් මහාචාර්ය ඩබ්. එම්. අබේරත්න බණ්ඩාර මහත්මා පත් වූ අතර, ආයතන ඵලදායීතාව හා කාර්යක්ෂමතාව වර්ධනය සඳහා එතුමා විසින් විශේෂ පියවර කිහිපයක් ගන්නා ලදී.

2011 වර්ෂය තුළ ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන්හි සමස්ත ප්‍රගතිය මෙම වාර්තාවෙහි 2-8 දක්වා ඇති ශීර්ෂ යටතේ දක්වා ඇත.

## 2.0 ජාතික අධ්‍යාපන ආයතන සංවිධාන ව්‍යුහය

### 2.1 ආයතන සභාව - 2011

ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් එහි ආයතන සභාව වෙත පහත සඳහන් බලතල පැවරී ඇත.

- ව්‍යවස්ථාවෙන් නියම කරන ලද බඳවා ගැනීමේ පටිපාටි හා පත් කිරීම් සම්බන්ධ ක්‍රියා පිළිවෙලට අනුව ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම.
- ආයතනයේ කාර්ය මණ්ඩල සේවා සම්බන්ධ නියමයන් සහ කොන්දේසි, වැටුප්, වේතන හා අනෙකුත් පාරිතෝෂික ඇතුළු කාර්ය මණ්ඩල සේවා ගෙවීම් සම්බන්ධ නීති රීති තීරණය කිරීම.

- ආයතනයේ විනය සම්බන්ධ නීති රීති සම්පාදනය කිරීම.
- ආයතන කාර්ය මණ්ඩල ප්‍රතිලාභ හා අර්ථ සාධක ගෙවීම් සම්බන්ධ අරමුදල් ස්ථාපිත කිරීම හා විධිමත් කිරීම.

2011 වසරේ ආයතනයේ ආයතන සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| එච්.එම්. ගුණසේකර මහතා<br>*(ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය)* | - | සභාපති |
| මහාචාර්ය ඩබ්ලිව්. එම්. අබේරත්න බණ්ඩාර මහතා<br>*(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | - | සාමාජික |
| *මහාචාර්ය එස්. සන්දරසේගරම් මහතා*<br>*(හිටපු පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)* | - | *සාමාජික* |
| *මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා*<br>*(මහාචාර්ය, වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය)* | - | *සාමාජික* |
| *මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා*<br>*(ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / අධ්‍යක්ෂ, දෘෂ්‍ය හා ප්‍රාසාංගික කලා විශ්වවිද්‍යාලය)* | - | *සාමාජික* |
| *මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා*<br>*(ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)* | - | *සාමාජික* |
| *ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා*<br>*(අධ්‍යක්ෂ ජනරාල්, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම)* | - | *සාමාජික* |
| *මංජුල මාකුඹුර මහතා*<br>*(නීතිඥ)* | - | *සාමාජික* |
| *ආර්. උඩුවාවල මහතා*<br>*(අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)* | - | *සාමාජික* |
| *පී. රනේපුර මහතා*<br>*(අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යංශය)* | - | *සාමාජික* |
| *වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතා*<br>*(වෛද්‍ය නිලධාරි, මූලික රෝහල, කිරිබත්ගොඩ)* | - | *සාමාජික* |
| *වී.සී.ඩී.පී. පෙරේරා මිය*<br>*(ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි, ඉංග්‍රීසි දෙපාර්., ජා.අ.ආ)* | - | *ආයතන සභා ලේකම්* |

## 2.2 ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය - 2011

ආයතන සභාවට අමතර ව ආයතනයේ සියලු ම ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දීමට අධ්‍යාපන කළමනාකරණ, පරිපාලන හා වෙනත් ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් ඇති විද්වතුන්ගෙන් සමන්විත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත් වන අතර එමගින් ආයතනයේ පහත දැක්වෙන ශාස්ත්‍රීය කාර්යයන් සම්බන්ධයෙන් අධ්‍යාපනික නායකත්වය, සුපරික්ෂණය සහ උපදේශනය ලබා දෙයි.

- සියලු ම ශාස්ත්‍රීය කාර්යවල දී ආයතන සභාවට උපදෙස් සැපයීම.
- ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධ ව ආයතන සභාව විසින් පවරන ලද කටයුතු සම්බන්ධයෙන් කරුණු සමාලෝචනය කොට වාර්තා කිරීම.

- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම.
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලා, පුහුණු වැඩසටහන් හා විභාග සඳහා සිසුන් බඳවා ගැනීම පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම.
- ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ විභාග වලට අදාළ නීති රීති සම්පාදනය කිරීම හා ඒවා ආයතන සභාවට ඉදිරිපත් කිරීම.
- ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග පරික්ෂකවරුන් වශයෙන් පත් කිරීමට සුදුසු අයගේ නම් ආයතන සභාවට නිර්දේශ කිරීම.
- ශාස්ත්‍රීය කාර්ය හා සම්බන්ධ ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදාන පිළිබඳ නීතිරීති සහ ඒවායේ ස්වභාවය පිළිබඳ ව ආයතන සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ආයතන සභාව මඟින් අනුමත කොන්දේසි සම්පූර්ණ කරන ලද පුද්ගලයන් සඳහා ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදානය කිරීම හා
- ආයතන සභාවේ අනුමැතිය ඇතිව විවිධ කමිටු සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඇතුළත් පුද්ගලයන්ට පරිබාහිර පුද්ගලයන් පත් කිරීම.

**2011 වසරේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සමන්විත වූයේ පහත දැක්වෙන විද්වතුන්ගෙනි.**

මහාචාර්ය ඩබ්ලිව්. ආරියදාස ද සිල්වා මහතා - සභාපති
*(හිටපු පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)*

මහාචාර්ය ඩබ්ලිව්. එම්. අබේරත්න බණ්ඩාර මහතා - සාමාජික
*(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)*

*මහාචාර්ය එස්. විදානපතිරණ මහතා* - *සාමාජික*
*(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ක්ෂුද්‍ර ජීව විද්‍යා දෙපාර්. කැලණිය විශ්වවිද්‍යාලය)*

*මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා* - *සාමාජික*
*(හිටපු උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)*

*ආර්. එස්. මැදගම මහතා* - *සාමාජික*
*(විශ්‍රාමික අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ක්‍රියාත්මක කිරීමේ ඒකකය)*

*අනුර එදිරිසිංහ මහතා* - *සාමාජික*
*(කොමසාරිස්, විභාග දෙපාර්තමේන්තුව)*

*තිස්ස නන්දසේන මහතා* - *සාමාජික*
*(ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම)*

*වී. මුතුකුමාරස්වාමි මහතා* - *සාමාජික*
*(විදුහල්පති, හින්දු විද්‍යාලය කොළඹ 04)*

*ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර මහතා* - *සාමාජික*
*(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)*

ආචාර්ය පී. සී. පී. ජවුෆර් මහතා - සාමාජික
*(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අධ්‍යාපන පීඨය, විවෘත විශ්වවිද්‍යාලය)*

*තිස්ස හේවාවිතාරණ මහතා* - *සාමාජික*
*(ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යංශය)*

*ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර මිය* - *සාමාජික*
*(ස.අ.ජ. / පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන පීඨය, ජා.අ.ආ.)*

*ඩබ්ලිව්. සියඹලාගොඩ මහතා* - *සාමාජික (2011.03.31 දක්වා)*
*(ස.අ.ජ. / භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජා.අ.ආ.)*

*එල්. එච්. විජේසිංහ මහතා* - *සාමාජික (2011.03.22 සිට 2011.07.05 දක්වා)*
*(ස.අ.ජ. / විද්‍යා හා තාක්ෂණ පීඨය, ජා.අ.ආ.)*

*අයි. එම්. කේ. බී. ඉලංගසිංහ මහතා* - *සාමාජික (2011.04.12 සිට)*
*(ස.අ.ජ. / අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන පීඨය, ජ.අ.ආ)*

*එස්. අටුගොඩ මහතා* - *සාමාජික (2011.03.22 සිට2011 06.20 දක්වා)*
*(ස.අ.ජ. / විකල්ප අධ්‍යාපන පීඨය, ජා.අ.ආ.)*

*ආචාර්ය එන් වන්නිආරච්චි මිය* - *සාමාජික (2011.06.20 සිට)*
*(ස.අ.ජ. / විකල්ප අධ්‍යාපන පීඨය, ජා.අ.ආ.)*

*ආචාර්ය ජී. කොඩිතුවක්කු මහතා* - *සාමාජික (2011.04.01 සිට)*
*(ස.අ.ජ. (වැ.බ.) / භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජා.අ.ආ.)*

*එම්.එන්.එස්.පී. ජයවර්ධන මහතා* - *සාමාජික (2011.09.06 සිට)*
*(ස.අ.ජ.(වැ.බ) විද්‍යා හා තාක්ෂණ පීඨය, ජා.අ.ආ.)*

*වී.සී.ඩී.පී. පෙරේරා මිය* - *ලේකම්*
*(ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි, ඉංග්‍රීසි දෙපාර්., ජා.අ.ආ)*

### 2.3 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය හා අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය මගින් 2011 වසරේ දී ආයතන සභා රැස්වීම් 12ක් හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් 13ක් සම්බන්ධීකරණය කොට තිබේ.

2011 වසරේ දී ද ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් කාර්යක්ෂම විගණන සේවාවක් පවත්වා ගෙනයන ලදී.

### 2.4 පීඨ / අංශ

2011 වර්ෂයෙහි ආයතනයේ සංවිධාන ව්‍යුහය පහත සඳහන් එක් එක් පීඨ සහ අංශ යටතේ ක්‍රියාත්මක විය.

#### 2.4.1 භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

සිංහල දෙපාර්තමේන්තුව
දෙමළ දෙපාර්තමේන්තුව
ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව
සෞන්දර්ය දෙපාර්තමේන්තුව
ආගම් දෙපාර්තමේන්තුව

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා සම්බන්ධීකරණ මැදිරිය

### 2.4.2 විද්‍යා හා තාක්ෂණ පීඨය

විද්‍යා, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ගණිත දෙපාර්තමේන්තුව
තාක්ෂණික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

### 2.4.3 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන පීඨය

පාසල් කළමනාකරණ දෙපාර්තමේන්තුව
අධ්‍යාපන පරිපාලන දෙපාර්තමේන්තුව
ගුරු බලවන්තකරණ දෙපාර්තමේන්තුව
ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව
විභාග දෙපාර්තමේන්තුව
මාර්ගෝපදේශන හා උපදේශන මැදිරිය

### 2.4.4 විකල්ප අධ්‍යාපන පීඨය

විවෘත පාසල් දෙපාර්තමේන්තුව
විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව
පුස්තකාල දෙපාර්තමේන්තුව
අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### 2.4.5 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන පීඨය

පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව
සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව
බාහිර සබඳතා මැදිරිය

### 2.4.6 සාමාන්‍ය, මූල්‍ය හා තාක්ෂණ පරිපාලන අංශය

මුදල් දෙපාර්තමේන්තුව
පරිපාලන දෙපාර්තමේන්තුව
ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව
ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## 3.0 2011 වර්ෂයේ විශේෂ සිදුවීම්

- මහාචාර්ය ඩබ්ලිව්. එම්. අබේරත්න බණ්ඩාර මහත්මා ආයතනයේ 09 වන අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් 2011 ජනවාරි 03 දින වැඩ භාර ගැනීම.
- ජාතික අධ්‍යාපන ආයතනයෙහි සහ අධ්‍යාපන අමාත්‍යාංශයෙහි විෂය අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ රැස්වීම් පැවැත්වීම ආරම්භ කිරීම සමඟ ම ආයතන දෙකෙහි ක්‍රියාකාරකම් මනා සම්බන්ධතාවකින් යුතු ව සිදු කිරීමට මග සැලසීම.

- සුදුසුකම් ලත් පුද්ගලයන් ආයතනයට බඳවා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව හා තනතුරු නාම සහිත නව සංවිධාන ව්‍යුහයක් සකස්කොට ඒ සඳහා කාර්ය මණ්ඩල සංශෝධන කමිටුවෙහි අනුමැතිය ලබා ගැනීම.
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ වූ පුරප්පාඩු සහ කලක් තිස්සේ පුරප්පාඩු ව තිබූ විෂය අධ්‍යක්ෂ තනතුරු හතක් පිරවීමට කටයුතු යෙදීම.
- ජාතික අධ්‍යාපන ආයතනයේ වර්ෂ 05ක අවම සේවය සහිත පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සම්පූර්ණ කළ සහකාර ව්‍යාපෘති නිලධාරින් 21 දෙනෙකු ව්‍යාපෘති නිලධාරී තනතුරට උසස් කිරීම.
- කාර්ය මණ්ඩල විනය ඉහල නැංවීමට හේතුවන පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ ඇඟිලි සලකුණු අංකිත යන්ත්‍රයක් හා දෛනික රාජකාරි කටයුතු වාර්තා කිරීමේ දිනපොතක් හඳුන්වා දීම.
- ආයතන ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් එහි කාර්ය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි හා දෙමළ භාෂා මෙන් ම පරිගණක පාඨමාලා ද ආරම්භ කිරීම.
- ආයතන නිලධාරින් 36 දෙනෙකුට පොදු රාජ්‍ය මණ්ඩල විද්‍යුත් කේන්ද්‍රයේ ( CEMCA ) සහයෝගීතාව ඇතිව බහු මාධ්‍ය භාවිතය පිළිබඳ පුහුණුවක් ලබා දීම.
- ආයතනයේ විභාග කාර්යයන්හි කාර්යක්ෂමභාවය හා විනිවිදභාවය ඉහළ නැංවීම වෙනුවෙන් ශිෂ්‍ය තොරතුරු කළමනාකරණය සඳහා විද්‍යුත් මාර්ගික තොරතුරු ක්‍රමයක් හඳුන්වා දීමට අභ්‍යන්තර නිළධාරින් කණ්ඩායමක් මගින් කටයුතු යෙදීම.
- දශක තුනකට ආසන්න කාල සීමාවක් තුළ ත්‍රස්තවාදී යුද්ධයෙන් පීඩා විඳි උතුරු හා නැගෙනහිර පළාත්වල අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි වෘත්තිකයන් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා සලසා දීම.
- තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය නමැති වැඩසටහන යටතේ ගුරු අධ්‍යාපන ආයතනයන්හි ගුණාත්මක බව හා නිර්මාණශීලි බව සංවර්ධනය කිරීමේ අරමුණින් "පශ්චාත් යුධ සමයේ සාමය" ගොඩනැගීමේ වැඩසටහන හඳුන්වා දීම. ඒ යටතේ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පිරිසක් ඇතුළු ගුරු අධ්‍යාපනඥයින් 59 දෙනකු පුහුණුකරුවන් ලෙස පුහුණු කරන ලද අතර, ඔවුන් මඟින් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සිසුන් 2766ක් පුහුණු කිරීම.
- ජනාධිපති කාර්යසාධන වැඩසටහනේ සහයෝගීතාව ඇතිව ඉංග්‍රිසි කථන නිපුණතාවය හා සම්බන්ධ කථන සහ ශ්‍රවන කුසලතා මැනීමේ උපකරණ 7,8 හා 9 ශ්‍රේණි සඳහා සකස් කිරීම.

- වඩා ගුණාත්මක වූ පුස්තකාල සේවාවක් ආයතන සේවා දායකයන් වෙත සැපයීමේ අරමුණින් ආයතන පුස්තකාලයට විශේෂිත වූ මෘදුකාංගයක් හඳුන්වා දීමට පියවර ගැනිම.
- අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම සඳහා අතිරේකව ලැබුනු රුපියල් මිලියන 15ක් යොදවා විභාග හා ප්‍රකාශන දෙපාර්තමේන්තුවලට අත්‍යවශ්‍ය උපකරණ සහ පුස්තකාලය සඳහා අවශ්‍ය වාර ප්‍රකාශන හා අධ්‍යාපන මෘදුකාංග මිලදී ගැනීම.
- ආයතනය මගින් වාර්ෂික ව ඉටුකරනු ලබන ස්වේච්ඡා සේවයක් වන, ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි මාණ්ඩලික නිලධාරී මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමෙහි වැඩ සටහන මගින් නිලධාරීන් 100 දෙනෙකු සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ පාඨමාලාවක් පැවැත්වීම.
- දකුණු ආසියානු කලාපය තුළ ගුරු සංවර්ධන ක්‍රියාවලියේ පරිණාමනය උදෙසා උපදේශකාත්මක භූමිකාවක් සැපයීම සඳහා යුනෙස්කෝ අනුග්‍රහය ඇතිව ගුරු සංවර්ධනය සඳහා වන දකුණු ආසියානු මධ්‍යස්ථානය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම. ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන දකුණු ආසියානු රටවල් අතර ගුරු සංවර්ධනය සඳහා අවශ්‍ය නව්‍යකරණ ප්‍රවේශයන්, පර්යේෂණ අනාවරණ මෙන් ම අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනිම මෙහිදි අවධාරණය කෙරේ.

## 4.0 විෂයමාලා සංවර්ධනය

විෂයමාලා සංවර්ධනය කරනු ලබන්නේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විද්‍යා හා තාක්ෂණ පීඨය මගිනි.

විෂයමාලා සම්පාදනය සඳහා ආයතනයට හිමි පහත සඳහන් බලතල යටතේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අයත් දෙපාර්තමේන්තු 7 සහ ද්විභාෂා මැදිරියත් විද්‍යා හා තාක්ෂණ පීඨයට අයත් දෙපාර්තමේන්තු 5ක් මගින් 2011 වර්ෂයේ දී ව්‍යාපෘති 70ක් ක්‍රියාත්මක කරන ලදී.

- සමාජ, සංස්කෘතික, ආර්ථික සහ තාක්ෂණික අවශ්‍යතාවලට ගැළපෙන පරිදී විෂයමාලා සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පුනරික්ෂණ සහ සංශෝධන කටයුතු කිරීම.
- විෂයමාලා නවීකරණ හා සමඟ ම අර්ථවත් ප්‍රායෝගික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා වන නව විධික්‍රම පාසල් පද්ධතියට හඳුන්වා දීම.
- විෂයමාලා සංවර්ධන හා ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි නියුක්ත පිරිස්වල වෘත්තීය නිපුණතා වැඩිදියුණු කිරීම.

- විෂයමාලා සංවර්ධන හා ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රවල තොරතුරු අනාවරණය කර ගැනීම සඳහාත්, අධ්‍යාපනයේ ගුණාත්මක ප්‍රවර්ධනය සඳහාත් ඉවහල් වන අධ්‍යයන ක්‍රියාත්මක කිරීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ හා ඇගයීම් ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය සඳහා නව විධික්‍රම හඳුන්වා දීම.
- ශිෂ්‍යයන්ගේ සන්නිවේදන, තොරතුරු තාක්ෂණ හා ජාතික සහ ජාත්‍යන්තර භාෂා නිපුණතා සංවර්ධනය.
- සංස්කෘතික හා ස්වාභාවික උරුමය රැක ගැනීමේ සහ ආරක්ෂා කර ගැනීමේ නිපුණතා සිසුන් තුළ ඇති කිරීම.
- සමාජයේ ජීවත් වන විවිධ ජන කණ්ඩායම්වලට ආවේණික ආගමික, සංස්කෘතික හා භාෂාමය වශයෙන් පවත්නා විවිධත්වය අගය කිරීමටත් ශ්‍රී ලාංකිකයන් ලෙස සැම දෙනාට ම එක් ව සිටීමටත් අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම.

විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් 2011 වර්ෂයේ දී නිම කළ විෂයමාලා කාර්යයන් පහත දැක්වේ.

- ප්‍රාථමික අධ්‍යාපනයෙහි නිරත ගුරුවරුන්ගේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් ආයතනයේ පූර්ව ළමාවිය සංවර්ධන සහ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව දියත් කළ ක්‍රියාමූලික පර්යේෂණ මාලාවට අදාළ ව ප්‍රකාශනයක් නිකුත් කිරීම. එයට මූල්‍යාධාර සැපයූ යුනිසෙෆ් ආයතනය මෙම කාර්යය, විශේෂ ඇගයුමට ලක් කිරීම, ආයතනයේ කීර්තිනාමය වර්ධනය වීමට හේතුවක් විය.
- 7 හා 11 ශ්‍රේණි සඳහා වන නව විෂයමාලාව සම්බන්ධ පළාත් හා කලාප මට්ටමේ ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂකවරුන් 1628 දෙනෙකු සඳහා වැඩිදුර පුහුණුව ලබා දීම.
- 9 ශ්‍රේණිය ගණිතය සඳහා ශිෂ්‍ය වැඩ පොතක් සහ 10 ශ්‍රේණිය ගණිතය සඳහා විද්‍යුත් අන්තර්ගතයක් සකස් කිරීම.
- 6-11 ශ්‍රේණි සම්බන්ධ අධ්‍යාපන මෘදුකාංග 15ක් නිර්මාණය කිරීම (විද්‍යාව 06, ඉංග්‍රීසි 04, භූගෝල විද්‍යාව 03 සහ ඉතිහාසය 02 හා විද්‍යාව සඳහා අධ්‍යාපන මෘදුකාංග 04ක් සංවර්ධනය කිරීම).
- 6-11 ශ්‍රේණි සඳහා සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපන සංයුක්ත තැටියක් සකස් කිරීම.
- අ.පො.ස උසස් පෙළ විෂයමාලා 35ක විෂය අන්තර්ගතය පිළිබඳ කරන ලද සමීක්ෂණයකින් අනතුරු ව අදාළ සංශෝධන සිදුකිරීම.
- අ.පො.ස උසස් පෙළ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව සඳහා ප්‍රායෝගික අත්පොත් 03ක් සකස් කිරීම.

- 12 හා 13 ශ්‍රේණිවලට අදාළ සම්පත් පුද්ගලයන් හා ගුරුවරුන් 5698ක් වෙනුවෙන් ශක්‍යතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- අ.පො.ස උසස් පෙළ තාක්ෂණික විෂයන් සඳහා සම්පත් පොත් සකස් කිරීම.
- සංඥා භාෂාව සම්බන්ධ ශිෂ්‍ය වැඩපොතක් හා විද්‍යුත් ඉගෙනුම් ද්‍රව්‍ය 02ක් සකස් කිරීම.
- බ්‍රේල් අධ්‍යාපනය සම්බන්ධ අවශ්‍යතා සමීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරු ව ඒ සම්බන්ධ ඉගෙනුම් පැකේජයක් සකස් කිරීම.
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ විෂයට අදාළ ව සකස් කෙරෙන වාග් මාලාව සඳහා ඉංග්‍රීසි *"P"* අක්ෂරය දක්වා වදන් 2014 ක් හඳුනා ගැනීම.
- ද්විභාෂා අධ්‍යාපනය සම්බන්ධ මධ්‍යම හා නැගෙනහිර පළාත් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ක්‍රියා මූලික පර්යේෂණ වැඩ සටහනක් දියත් කිරීම.
- ද්විභාෂා පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධ ආදර්ශ අතිරේක පැකේජයේ පළමු කෙටුම්පත සම්පූර්ණ කිරීම.
- විෂයමාලා ද්‍රව්‍යයන්හි භාෂාවේ ගුණාත්මක භාවය පවත්වාගැනීම සඳහා අන්තර් දෙපාර්තමේන්තු සංස්කරණ කමිටු පත් කිරීම.
- ආයතනයට අදාළ අධ්‍යාපන වෙබ් අඩවියක් සංවර්ධනය කිරීම.

## 4.1 විෂය නිර්දේශ සකස් කිරීම - 2011

- පහත දැක්වෙන විෂය නිර්දේශ සකස් කරන ලදී.

| | | |
|---|---|---|
| රුසියන් | - | 10 හා 11 ශ්‍රේණි |
| චීන | - | 10 හා 11 ශ්‍රේණි |
| හින්දි | - | 10 හා 11 ශ්‍රේණි |
| සංස්කෘත | - | 10 හා 11 ශ්‍රේණි |
| පාලි | - | 10 හා 11 ශ්‍රේණි |
| ජර්මන් | - | 10 හා 11 ශ්‍රේණි |
| ජපන් | - | 10 හා 11 ශ්‍රේණි |
| දෘඩ තාක්ෂණය (සිංහල) | - | 12 හා 13 ශ්‍රේණි |

- පහත සඳහන් විෂය නිර්දේශ නැවත විමර්ශනය කර අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී.

| | | |
|---|---|---|
| රසායන විද්‍යාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - | 12 හා 13 ශ්‍රේණි |
| භෞතික විද්‍යාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - | 12 හා 13 ශ්‍රේණි |
| ජීව විද්‍යාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - | 12 හා 13 ශ්‍රේණි |
| ඉංජිනේරු තාක්ෂණය | | |
| ගිණුම්කරණය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - | 12 හා 13 ශ්‍රේණි |
| ආර්ථික විද්‍යාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - | 12 හා 13 ශ්‍රේණි |
| ව්‍යාපාර අධ්‍යයනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - | 12 හා 13 ශ්‍රේණි |

**4.2 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීම - 2011**

- පහත දැක්වෙන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ 78ක් සකස් කරන ලදී.

| | | |
|---|---|---|
| නාට්‍ය හා රංග කලාව (දෙමළ ) | - | 6 ශ්‍රේණිය |
| භූගෝල විද්‍යාව (ඉංග්‍රීසි) | - | 7 ශ්‍රේණිය |
| නාට්‍ය හා රංග කලාව (දෙමළ) | - | 7 ශ්‍රේණිය |
| භූගෝල විද්‍යාව | - | 9 ශ්‍රේණිය |
| චිත්‍ර (දෙමළ) | - | 9 ශ්‍රේණිය |
| ඉතිහාසය (ඉංග්‍රීසි) | - | 9 ශ්‍රේණිය |
| ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය (ඉංග්‍රීසි) | - | 9 ශ්‍රේණිය |
| විද්‍යාව (ඉංග්‍රීසි) | - | 9 ශ්‍රේණිය |
| හින්දි | - | 10 ශ්‍රේණිය |
| සංස්කෘත | - | 10 ශ්‍රේණිය |
| රුසියන් | - | 10 ශ්‍රේණිය |
| පාලි | - | 10 ශ්‍රේණිය |
| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය (සිංහල) | - | 10 ශ්‍රේණිය |
| නාට්‍ය හා රංග කලාව (දෙමළ) | - | 10 ශ්‍රේණිය |
| හින්දි | - | 11 ශ්‍රේණිය |
| පාලි | - | 11 ශ්‍රේණිය |
| සංස්කෘත | - | 11 ශ්‍රේණිය |
| රුසියන් | - | 11 ශ්‍රේණිය |
| අරාබි | - | 11 ශ්‍රේණිය |
| නාට්‍ය හා රංග කලාව (දෙමළ) | - | 11 ශ්‍රේණිය |
| විද්‍යා (රසායන විද්‍යා කොටස) ඉංග්‍රීසි | - | 11 ශ්‍රේණිය |
| අරාබි | - | 12 ශ්‍රේණිය |
| ජපන් | - | 12 ශ්‍රේණිය |
| ගිණුම්කරණය (ඉංග්‍රීසි) | - | 12 ශ්‍රේණිය |
| ව්‍යාපාර අධ්‍යයනය | - | 12 ශ්‍රේණිය |
| දේශපාලන විද්‍යාව (ඉංග්‍රීසි) | - | 12 ශ්‍රේණිය |
| ගණිතය (දෙමළ) | - | 12 ශ්‍රේණිය |
| කෘෂිකර්මය (ඉංග්‍රීසි) | - | 12 ශ්‍රේණිය |
| ආහාර තාක්ෂණ විද්‍යාව හා තාක්ෂණවේදය (දෙමළ) | - | 12 ශ්‍රේණිය |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (සිංහල / දෙමළ) | - | 12 ශ්‍රේණිය |
| හින්දි | - | 12 හා 13 ශ්‍රේණි |
| හින්දු ධර්මය | - | 13 ශ්‍රේණිය |
| හින්දු ශිෂ්ඨාචාරය | - | 13 ශ්‍රේණිය |
| ඉස්ලාම් ධර්මය | - | 13 ශ්‍රේණිය |
| ඉස්ලාම් ශිෂ්ඨාචාරය | - | 13 ශ්‍රේණිය |
| ක්‍රිස්තියානි ධර්මය (සිංහල / දෙමළ) | - | 13 ශ්‍රේණිය |
| ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය | - | 13 ශ්‍රේණිය |
| ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරය | - | 13 ශ්‍රේණිය |

| | | |
|---|---|---|
| සිංහල | - | 13 ශ්‍රේණිය |
| දෙමළ | - | 13 ශ්‍රේණිය |
| ඉංග්‍රීසි | - | 13 ශ්‍රේණිය |
| සංස්කෘත | - | 13 ශ්‍රේණිය |
| පාලි | - | 13 ශ්‍රේණිය |
| චීන | - | 13 ශ්‍රේණිය |
| ජර්මන් | - | 13 ශ්‍රේණිය |
| රුසියන් | - | 13 ශ්‍රේණිය |
| අරාබි | - | 13 ශ්‍රේණිය |
| ජපන් | - | 13 ශ්‍රේණිය |
| පෙරදිග සංගීතය | - | 13 ශ්‍රේණිය |
| බටහිර සංගීතය | - | 13 ශ්‍රේණිය |
| නර්තනය | - | 13 ශ්‍රේණිය |
| නාට්‍ය හා රංග කලාව (සිංහල / දෙමළ) | - | 13 ශ්‍රේණිය |
| චිත්‍ර (සිංහල) | - | 13 ශ්‍රේණිය |
| කර්නාටක සංගීතය | - | 13 ශ්‍රේණිය |
| භාරත නාට්‍ය | - | 13 ශ්‍රේණිය |
| ඉතිහාසය (සිංහල/ දෙමළ) | - | 13 ශ්‍රේණිය |
| දේශපාලන විද්‍යාව (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| භූගෝල විද්‍යාව (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය (සිංහල / දෙමළ) | - | 13 ශ්‍රේණිය |
| සන්නිවේදනය හා මාධ්‍යය අධ්‍යාපනය (සිංහල) | - | 13 ශ්‍රේණිය |
| ව්‍යාපාර අධ්‍යයනය (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| ගිණුම්කරණය (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| ව්‍යාපාර සංඛ්‍යානය (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| ආර්ථික විද්‍යාව (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| ගණිතය (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| සංයුක්ත ගණිතය (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| භෞතික විද්‍යාව (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| රසායන විද්‍යාව (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| ජීව විද්‍යාව (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| විදුලි ඉලෙක්ට්‍රොනික් හා තොරතුරු තාක්ෂණවේදය (සිංහල / දෙමළ ) | - | 13 ශ්‍රේණිය |
| සිවිල් තාක්ෂණ වේදය (සිංහල / දෙමළ ) | - | 13 ශ්‍රේණිය |
| ගෘහ ආර්ථික විද්‍යාව (සිංහල / දෙමළ) | - | 13 ශ්‍රේණිය |
| ජීව විද්‍යාව හා තාක්ෂණවේදය (සිංහල / දෙමළ) | - | 13 ශ්‍රේණිය |
| කෘෂි විද්‍යාව (සිංහල / දෙමළ) | - | 13 ශ්‍රේණිය |
| යාන්ත්‍රික තාක්ෂණය (සිංහල) | - | 13 ශ්‍රේණිය |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (සිංහල / දෙමළ/ඉංග්‍රීසි) | - | 13 ශ්‍රේණිය |
| ආහාර තාක්ෂණ විද්‍යාව | - | 13 ශ්‍රේණිය |

## 4.3 අතිරේක කියවීම් පොත - 2011

- පහත දැක්වෙන අතිරේක කියවීම් පොත් පහක් සකස් කරන ලදී.

| | | |
|---|---|---|
| දෘඩ හා තාක්ෂණය (සිංහල ) | - | 12 ශ්‍රේණිය |
| ජීව විද්‍යා තාක්ෂණය | - | 12 ශ්‍රේණිය |
| විදුලි ඉලෙක්ට්‍රොනික් හා තොරතුරු තාක්ෂණය (සිංහල) | - | 13 ශ්‍රේණිය |
| ගෘහ ආර්ථික විද්‍යාව (සිංහල) | - | 13 ශ්‍රේණිය |
| කෘෂි විද්‍යාව (සිංහල) | - | 13 ශ්‍රේණිය |

## 4.4 සේවාස්ථ පුහුණුව

2011 වර්ෂය තුළ විදුහල්පතිවරු, ගුරු උපදේශකවරු, විෂය අධ්‍යක්ෂවරු හා ගුරුවරුන් 10,643 දෙනෙකු සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

පළාත් අධ්‍යාපන කළමනාකාරිත්වයේ සහයෝගය ඇතිව ගුරුවරුන් අතර ද්විභාෂා අධ්‍යාපනය ප්‍රචලිත කිරීමේ වැඩ සටහන් යටතේ උතුරු හා නැගෙනහිර පළාත් වල පිරිවෙන් හා රජයේ ආධාර ලබන පාසල් ගුරුවරුන් 36 දෙනෙකු පුහුණු කිරීම.

## 5.0 වෘත්තීය සංවර්ධනය

අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ ස්ථරවල සේවයෙහි නිරත වෘත්තිකයන්ගේ වෘත්තීය සංවර්ධනය භාරව ඇති අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන පීඨය පාසල් කළමනාකරණ, අධ්‍යාපන පරිපාලන, ගුරු බලවන්තකරණ හා ආයතනික සංවර්ධන යන දෙපාර්තමේන්තු හතරකින් සමන්විත වේ. 2011 වර්ෂයේ දි එම පීඨය මගින් මෙහෙයවන මහරගම හා මීපේ පරිශ්‍රයන් හි පැවැත් වූ වෘත්තීය සංවර්ධන පාඨමාලා සඳහා 21,418 දෙනෙකු සහභාගි වූ අතර ඒ පිළිබඳ විස්තර 01 වන වගුවේ දැක්වේ.

## 01 වන වගුව : වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ විස්තර - 2011

| පාඨමාලාව | වගකීම දරන දෙපාර්තමේන්තුව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා** | | |
| අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාව (2008/2009,2009/2010 2011/2012 ) | ගුරු බලවන්තකරණ | 33 |
| අධ්‍යාපනපති පාඨමාලාව (2009/2011 & 2010/2012) | ගුරු බලවන්තකරණ | 157 |
| අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව (2009/2011 & 2011/2013) | අධ්‍යාපන පරිපාලන | 47 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා** | | |
| පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාව (2011/2012) | අධ්‍යාපන පරිපාලන | 54 |
| පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (අර්ධකාලීන) පාඨමාලාව (2011/2013) | අධ්‍යාපන පරිපාලන | 85 |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (2009/2010, 2011/2012,2012/2013) | ගුරු බලවන්තකරණ | 8423 |
| පශ්චාත් උපාධි පාසල් උපදේශන ඩිප්ලෝමාව (2009/2010) | ගුරු බලවන්තකරණ | 30 |
| **උපාධි පාඨමාලා** | | |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (2007/2009,2009/2001, 2011/2013) | ගුරු බලවන්තකරණ | 5120 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | |
| පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2010/2011) | පාසල් කළමනාකරණ | 204 |
| ප්‍රාථමික පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2011 - දෙමළ) | පාසල් කළමනාකරණ | 71 |
| විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2010)* සංඥා භාෂා ඩිප්ලෝමාව (2011)* | අන්තර්කරණ | 32 |
| දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමාව * (2011) | ඉංග්‍රීසි | 47 |
| පූර්ව ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව * (2011) | ප්‍රාථමික අධ්‍යාපනය | 37 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | |
| අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව (2010/2011) | ගුරු බලවන්තකරණ | 1114 |
| **කෙටි කාලීන තේමා පාඨමාලා** | | |
| අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ කෙටි කාලීන තේමා පාඨමාලා | අධ්‍යාපන පරිපාලන | 1181 |
| පර්යේෂණ ක්‍රම පිළිබඳ තේමා පාඨමාලාව | පර්යේෂණ හා සංවර්ධන | 250 |
| ශික්ෂණ ශාස්ත්‍ර නිපුණතාවය පිළිබඳ තේමා පාඨමාලාව | ගුරු බලවන්තකරණ | 50 |
| **විදේශීය සිසුන් සඳහා වන පාඨමාලා** | | |
| අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව | අධ්‍යාපන පරිපාලන | 45 |
| **උපාධිධාරීන් නොවන ගුරුවරුන් සඳහා වන පාඨමාලා** | | |
| නුපුහුණු උපාධිධාරි නොවන ගුරුවරුන් සඳහා වන ගුරු පුහුණු පාඨමාලාව | ආයතනික සංවර්ධන | 4367 |

* ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ප්‍රායෝගික ගැටළු හේතුවෙන් මෙම පාඨමාලා හතර පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව, මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අන්තර්කරණ දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු තුන විසිනි.

## 5.1 ගුරු ආයතනික සංවර්ධනය

පාසල් පද්ධතියේ විෂයමාලා සංශෝධන වලට අනුගත වන පරිදි ජාතික විද්‍යා පීඨ හා ගුරු විද්‍යාලවල පූර්ව-සේවස්ථ හා සේවස්ථ පුහුණු පාඨමාලා පැවැත්වීමට අදාළව ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේ දී පහත දක්වා ඇති කාර්යයන් ඉටු කර ඇත.

- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල විෂයමාලා සංශෝධනය යටතේ ප්‍රාථමික, සාමාන්‍ය හා විශේෂ විෂය නිර්දේශ සංශෝධනය කිරීම හා ඒ සඳහා කථිකාචාර්යවරු 215 දෙනකු පුහුණු කිරීම.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විද්‍යාලවල කාර්යයන් නියාමනය සඳහා අවශ්‍ය උපකරණයක් සකස් කිරීම.
- විද්‍යාපීඨ හා ගුරු විද්‍යාල ආචාර්ය මණ්ඩලවල වෘත්තීය සංවර්ධන අවශ්‍යතා පිළිබඳ කරන ලද සමීක්ෂණයකින් පසු ව විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් 215 දෙනෙකුට අධ්‍යාපන ව්‍යවහාර පිළිබඳ පුහුණුවක් ලබාදීම.
- ගුරු විද්‍යාල සඳහා ඇගයීම් පටිපාටියක් සකස් කිරීම.

## 5.2 මාර්ගෝපදේශනය හා උපදේශනය

2011 වර්ෂයේදී සේවාස්ථ උපදේශන ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් කාර්යයන් නිම කර ඇත.

- සිසුන් 420 දෙනෙකු සඳහා උපදේශනය සැපයීම.
- දෙමාපියන් 600 දෙනෙකු, ගුරුවරුන් 50 දෙනෙකු, දෙමාපියන් 30 දෙනෙකු හා අනෙකුත් පාර්ශවකරුවන් 100 දෙනෙකු සඳහා උපදේශන සේවා සැපයීම.
- ප්‍රසිද්ධ දේශන 03ක් පැවැත්වීම සහ ඒ සඳහා 1000ක පිරිසක් සහභාගි වීම.
- ශිෂ්‍ය උපදේශන කාර්යයට අදාළ ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘති 15 ක් සිදු කිරීම.
- ගුරු උපදේශකවරු 120ක් හා විශේෂ අධ්‍යාපනය පිළිබඳ උපදේශකවරු 47 දෙනෙකු සඳහා ශක්‍යතා සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.

## 5.3 ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීම.

ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාදව තිබූ සියලු විභාග ප්‍රතිඵල 2011 වර්ෂයේදී නිකුත්කොට අවසන් කරන ලද අතර පහත සඳහන් කාර්යයන් ද සම්පූර්ණ කොට ඇත.

- විභාග 14 ක් පැවැත්වීම.
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ 2009 / 2010 අධ්‍යාපන වර්ෂය, 1වන වසර කණ්ඩායමේ 8,343ක් වූ අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීම.
- පසුගිය වර්ෂයේ විභාග සහතික 1950ක් නිකුත් කිරීම.

## 6.0 විකල්ප අධ්‍යාපනය

### 6.1 විවෘත ඉගෙනුම

විවිධ හේතු නිසා විධිමත් අධ්‍යාපන අවස්ථා අහිමි වූ කණ්ඩායම් සඳහා දුරස්ථ අධ්‍යාපන සංකල්පය යටතේ පාඨමාලා පැවැත්වීමේ අරමුණින් ජාතික අධ්‍යාපන ආයතනය විවෘත පාසල් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. දුරස්ථ හා විවෘත ඉගෙනුම් ක්‍රම උපයෝගී කරගනිමින් අධ්‍යාපනය ඉගෙනුම්ලාභියා අභියසට ගෙන යාම මෙම ක්‍රියාවලිය තුළින් සිදුවේ. අධ්‍යාපන සුදුසුකම්, රැකියාව, සමාජ ස්ථරායනය නොසලකා, සියළු දෙනාහට අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. විවෘත පාසල, ඉගෙනුම් ලාභියාට තම ඉගෙනුම කුමන ඉගෙනුම් මාධ්‍යයක් උපයෝගි කරගනිමින් කෙදිනක ආරම්භ කළ යුතු ද යන්න පිළිබඳ තීරණය කිරිමේ ලා පහසුකම් සලසන අතර ඕනෑම උචිත අවධියකදී ඉගෙනුම ආරම්භ කිරීමට ද සහාය වෙයි.

විවෘත ඉගෙනුම් වැඩ සටහන් යටතේ විවෘත පාසල් පහත සඳහන් ක්‍රියාකාරකම් දෙපාර්තමේන්තුව මගින් පසුගිය වසර තුළදී නිමකරන ලදී.

- මධ්‍යස්ථාන 06 කදී උපදේශකවරුන් 40 ක ගේ සහාය ඇතිව, ඉගෙනුම්ලාභින් 1802 දෙනෙකු සඳහා විවෘත අධ්‍යාපන පදනම් පාඨමාලාව හා විවෘත අධ්‍යාපන ද්විතීයික පාඨමාලාව හැදැරීම සඳහා අවස්ථා සැපයීම.
- විවෘත අධ්‍යාපනය හරහා ප්‍රජා අධ්‍යාපනය සඳහා වන මොඩියුල 03ක් සකස් කිරීම.
- විවෘත පාසල් මධ්‍යස්ථාන 10 කදී සම්මුඛ සැසි 32ක් පැවැත්විම.
- ජංගම ඉගැන්වීම් වැඩමුළු 05ක් පැවැත්වීම.
- නව විවෘත පාසල් මධ්‍යස්ථාන 03 ක් ස්ථාපිත කිරීම සහ ඉගෙනුම්ලාභින් 400 ක් බඳවා ගැනීම.

### 6.2 විද්‍යුත් ප්‍රචාරණ

නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආකර්ෂනීය හා කාර්යක්ෂම ඉගෙනුම් / ඉගැන්වීම් උපකරණ වන රූපවාහිනිය, ගුවන්විදුලිය සහ සංයුක්ත තැටි භාවිතා කරමින් පාසල් ප්‍රජාව මෙන්ම ඉන් බාහිර ප්‍රජාව ඉගෙනුම් සමාජයක් කරා ගෙන යෑම සඳහා අති විශාල සේවයක් ජාතික අධ්‍යාපන ආයතනයේ විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව හරහා ඉටු වේ.

විෂයමාලාවේ දුරවබෝධ සංකල්ප පැහැදිලි කිරීම සඳහාත්, එහි සිදු වන කාලීන වෙනස්කම් පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම සඳහාත් ගීතය, නාට්‍යය, සංගීතය වැනි සෞන්දර්යාත්මක මාධ්‍ය යොදා ගනිමින්, විවිධ වැඩසටහන් නිෂ්පාදනය කිරීම ද මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයකි. මේ යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් 2011 වර්ෂය තුළ නිම කොට තිබේ.

- නැණස රූපවාහිනී වැඩසටහන් 537 ක් නිෂ්පාදනය කොට විකාශනය සඳහා භාරදීම.
- ප්‍රාථමික හා ද්විතීයික විෂයමාලා හා කාලීන අධ්‍යාපනික ගැටලු පිළිබඳ ගුවන් විදුලි වැඩ සටහන් පිටපත් රචනය සඳහා විෂය විශේෂඥයන් 79 දෙනකු පුහුණු කිරීම.
- සතිපතා ගුවන් විදුලි වැඩ සටහනක් වන "නිපුණ" වැඩ සටහන් 48ක සහ "මේ අපේ පාසලයි" වැඩ සටහන් 24ක නිෂ්පාදන කටයුතු අවසන් කිරීම.
- මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය කිරීම සඳහා පාසල් සුරක්ෂිතභාවය පිළිබඳ දෘෂ්‍ය වැඩ සටහනක් හා ශ්‍රව්‍ය වැඩසටහනක් නිෂ්පාදනය කිරිම සහ ඒ ආශ්‍රිත පෝස්ටර් තරගයක් පැවැත්විම.
- දෘෂ්‍ය මාධ්‍ය ඉගෙනුම් උපකරණ පන්ති කාමරයේ භාවිතා කිරීම පිළිබඳ ගුරුවරුන් 50 දෙනෙකු පුහුණු කිරීම.

### 6.3 අන්තර්කරණ අධ්‍යාපන

සැමට අධ්‍යාපන සංකල්පය යථාර්ථයක් කර ගැනිමේ ලා ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට විශේෂ ස්ථානයක් හිමිවේ. විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වෙනුවෙන් විවිධ වැඩ සටහන් දියත් කරන අතරතුර ම, මෙම දෙපාර්තමේන්තුව එම දරුවන්ගේ දෙමාපියන් වෙනුවෙන් ද විශේෂ උපදේශන වැඩ සටහන් ක්‍රියාත්මක කරයි.

මේ යටතේ එම දෙපාර්තමේන්තුව 2011 වසරේ දී නිම කළ කාර්යයන් පහත දැක්වේ.

- අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ වන කාලීන තොරතුරු ඇතුළත් සඟරාවක් එළිදැක්විම.
- සංඥා භාෂාව පිළිබඳ විද්‍යුත් ඉගෙනුම් කට්ටලයක් සහ ඉගෙනුම් පොතක් සකස් කිරීම.
- ප්‍රාථමික ප්‍රධාන අවධියේ 2 වන ශ්‍රේණියේ කියවීම් පොතට අදාළ සංඥා භාෂා ශබ්දකෝෂයක් සකස් කිරීම.
- බේල් අධ්‍යාපනය හා සම්බන්ධ ගුරුවරු 50 දෙනෙකු පුහුණු කිරීම.

### 6.4 පුස්තකාලය

ජාතික අධ්‍යාපන ආයතන පුස්තකාලය එහි කාර්ය මණ්ඩලයට අමතර ව විශ්ව විද්‍යාල, අධ්‍යාපන විද්‍යා පීඨ හා ගුරු විද්‍යාල කාර්ය මණ්ඩල හා සිසුන් මෙන්ම වෙනත් අධ්‍යාපනඥයින් ද ඔවුන්ගේ ශාස්ත්‍රීය අරමුණු ඉටු කර ගැනීම සඳහා නිරන්තර පරිහරණයට බඳුන් කරයි.

එම පුස්තකාල එකතුව සඳහා 2011 වසරේ එකතු වූ දෑ පහත වේ.

| | |
|---|---|
| පොත් | 1003 |
| අධ්‍යාපනික වාර්තා | 146 |
| විෂයමාලා ද්‍රව්‍ය | 06 |
| දේශීය සඟරා | 05 |
| විදේශීය සඟරා | 06 |
| පුවත් පත්‍රිකා | 10 |
| අධ්‍යාපන තොරතුරු ඇතුළත් සංයුක්ත තැටි | 30 |

## 7.0 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ක්‍රියා කරන ආයතනයක් ලෙස, ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව හා බාහිර සබඳතා ඒකකය මගින් විවිධ පර්යේෂණ හා පාසල් කාර්යයන් ඔස්සේ විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දායකත්වය සපයයි.

### 7.1 පර්යේෂණ හා සංවර්ධන

අධ්‍යාපන පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම, අධ්‍යාපනයේ විවාදාත්මක අංශ සම්බන්ධ අදහස් හා මත පිළිබඳ සාකච්ඡා මණ්ඩප සැලසුම් කිරීම, අධ්‍යාපනයේ නියැලී පිරිස් සඳහා පාඨමාලා පැවැත්වීම, පර්යේෂණ ප්‍රදාන ලබාදීම, ඔවුන්ගේ පර්යේෂණ කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය, මෙන්ම පර්යේෂණ තොරතුරු ප්‍රචලිත කිරීම ද, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂයට අයත් ප්‍රධාන කාර්යයන් වේ. එම දෙපාර්තමේන්තුව මගින් 2011 වර්ෂයේ සිදු කළ කාර්ය පහත දැක්වේ.

- 9 වන ශ්‍රේණියේ නව විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව 2010 දී කරන ලද පර්යේෂණ වාර්තාව සම්පූර්ණ කිරීම.
- අධ්‍යාපනික ප්‍රජාව අතර පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීම සඳහා පර්යේෂණ වදන් හා අධ්‍යාපන වදන් ඇතුළත් ශබ්දමාලා සකස් කිරීම.
- 6-11 ශ්‍රේණිවල පාසල් විෂමාලාව තුළ අපදා කළමනාකරණ සංකල්ප කොතරම් දුරට සිරස්ව ඒකාබද්ධවී තිබේ ද යන්න සොයා බැලීම සඳහා කරන ලද පර්යේෂණයේ වාර්තාව සකස් කිරිම.
- කුඩා පාසල් කළමනාකරණය ශක්තිමත් කිරිම සඳහා උපයෝගී කර ගත හැකි සම්පත් කට්ටලයක් සකස් කිරිම.
- ද්විතීයික පාසල් විද්‍යා විෂයමාලාවේ අඩංගු කළමනාකරණ සංකල්ප පිළිබඳ CD තැටියක් නිපදවා ඒ පිළිබඳ ගුරුවරුන් 183 දෙනෙකුට පුහුණුව ලබාදීම.

- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු සහ අධ්‍යාපන අමාත්‍යාංශ කාර්ය මණ්ඩල සාමාජිකයන් 250 දෙනෙකු සඳහා අධ්‍යාපන පර්යේෂණ ක්‍රම විද්‍යා තේමා පාඨමාලා දෙකක් පැවැත්වීම.
- ආචාර්ය සි.ඩබ්ලිව් ඩබ්ලිව් කන්නන්ගර අනුස්මරණ දේශන මාලාවේ දේශන 12ක සිංහල පරිවර්තන සකස් කිරීම.
- වාර්ෂික ව පවත්වනු ලබන කන්නන්ගර අනුස්මරණ දේශනමාලාවේ 2011 වර්ෂයේ දේශනය ජාතික අධ්‍යාපන කොමිසමේ හිටපු සභාපති මහාචාර්ය ඒ.වී.සුරවීර මහත්මා විසින් "ආචාර්ය කනන්ගර නිදහස් අධ්‍යාපන යෝජනා හා ටියුෂන් ව්‍යාපාරයේ පශ්චාත් කාලීන ව්‍යාපෘතිය" යන මැයෙන් පැවැත්විම.

## 7.2 සැලසුම් හා ඇගයීම්

ජාතික අධ්‍යාපන අරමුණු හා සමගාමී ව ජාතික අධ්‍යාපන ආයතනයේ අභිමතාර්ථ ලඟා කර ගැනීම සඳහාත්, ආයතනය සතු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස යෙදවීම සඳහාත් 2011 වසර අවසානයේ දී සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ කාර්යයන් පහත දැක්වේ.

- 2012 – 2016 පස් අවුරුදු සැලැස්ම සකස් කිරීම.
- 2012 වාර්ෂික අයවැය සකස් කිරීම.
- 2012 වාර්ෂික ක්‍රියාත්මක කිරිමේ සැලැස්ම සකස් කිරීම
- 2011 වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කිරීම.
- 2011 වසරේ කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම.

## 7.3 බාහිර සබඳතා

ආයතන නිලධාරින්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඉවහල් වන විදේශීය වැඩසටහන් / පාඨමාලා සඳහා අවස්ථා සලසා දීම බාහිර සබඳතා මැදිරියෙහි ප්‍රධාන වගකීම වේ. එයට අමතරව අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩ සටහන (ESDG) යටතේ ලෝක බැංකුව මගින් ද දැනුමැති සමාජයක් උදෙසා අධ්‍යාපන වැඩසටහන (EKSP) යටතේ ආසියානු සංවර්ධන බැංකුව මගින් ද ජාතික එකාබද්ධතාවය හා ආපදා කළමනාකරණය යටතේ GIZ ආයතනය මගින් සහ මූලික හා ප්‍රාථමික අධ්‍යාපනය සඳහා UNICEF ආයතනය මගින් ද ආයතනයට සපයන මූල්‍යාධාර සම්බන්ධීකරණ කටයුතු මෙම මැදිරිය මගින් ඉටු කරයි.
කාර්ය මණ්ඩල සංවර්ධනය යටතේ ඉටු කළ කාර්යයන් පහත වේ.

- ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරින් එකොළොස් දෙනෙකු ඇමරිකාවේ වෝල්ඩන් (Walden) විශ්වවිද්‍යාලය මඟින් මෙහෙයවන ලද උපදේශන පිරි සැලසුම් පිලිබඳ විද්‍යුත් මාර්ගික පශ්චාත් උපාධි සහතික පත්‍ර පාඨමාලාව සාර්ථක ව සම්පූර්ණ කිරීම.

- ප්‍රංශයේ පැරිස් නුවර IIEP ආයතනය මඟින් මෙහෙය වන අධ්‍යාපන සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ උසස් පුහුණු වැඩසටහන සඳහා ආයතනය මඟින් සහභාගි කරන ලද නිලධාරියකු අධ්‍යාපන සැලසුම්කරණය හා කළමනාකරණය සම්බන්ධ අධ්‍යාපනපති උපාධිය හිමි කර ගැනීම.
- ඉන්දියාවේ හයිද්‍රාබාද් විශ්වවිද්‍යාලය මඟින් මෙහෙය වූ ඉංග්‍රීසි හා විදේශ භාෂා පිළිබඳ අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාවට යොමු කරන ලද නිලධාරියා එම උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම.
- මලයාසියාවේ පුත්‍ර මැලේසියා විශ්ව විද්‍යාලයෙහි එක් අවුරුදු අධ්‍යාපනපති පාඨමාලාව සඳහා යවන ලද ජාතික අධ්‍යාපන ආයතන නිලධාරීන් දෙදෙනකු එම පාඨමාලාව සම්පූර්ණ කිරීම.
- සුසාධ්‍ය කාරක කුසලතා පිළිබඳ පවත්වන ලද කළමනාකරණ පුහුණු වැඩ සටහන් සඳහා ආයතනයේ නිළධාරින් 06 දෙදෙනකු සහභාගි කරවීම.
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ආයතනයට යොමු කළ විදේශ පුහුණු වැඩ මුළු හා සම්මන්ත්‍රණ සඳහා නිළධාරින් සහභාගි කර වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරිම.

## 8.0 සාමාන්‍ය මූල්‍ය හා තාක්ෂණ පරිපාලන අංශය

ආයතනයේ ශාස්ත්‍රීය කටයුතුවල යෙදෙන පීඨ විසින් සිදු කරනු ලබන සියලුම කාර්ය සඳහා මූල්‍ය, භෞතික හා කළමනාකරණ සේවා සම්පාදනය හා සහාය සේවා සැපයීම සාමාන්‍ය මූල්‍ය හා තාක්ෂණ පරිපාලන අංශයේ කාර්යභාරයයි. මෙම පීඨය යටතේ වන පරිපාලන දෙපාර්තමේන්තුව එදිනෙදා ආයතනික පරිපාලන කාර්යය සම්බන්ධ සියලු කටයුතු හා කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනිමත් ඔවුන්ට අදාළ පුහුණු අවස්ථා දේශීය මට්ටමෙන් සැපයීමත් සිදු කරයි. ආයතනයේ සියලුම කාර්ය සඳහා මූල්‍ය සම්පත් ලබාදිම හා ආදායම් හා පිරිවැය වාර්තා මූල්‍ය නීතිරීති අනුව පවත්වාගෙන යෑමේ කටයුතු මුදල් දෙපාර්තමේන්තුව මගින්ද, ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරිම්, නඩත්තු කටයුතු, විදුලි සහ දුරකථන සේවා පවත්වාගෙනය යෑම, යටිතල පහසුකම් සැපයීම, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සම්බන්ධීකරණය හා ආයතනයේ භෞතික පරිසරය අධ්‍යාපනික කාර්යවලට සමීප වන අයුරින් පවත්වාගෙන යෑම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් ද ඉටුකරනු ලැබේ.

8.1 **පරිපාලන දෙපාර්තමේන්තුව**

- ආයතනය තුළ පවතින සේවක පුරප්පාඩු පිරවීම සඳහා 2011 වසරේදී ජාතික අධ්‍යාපන ආයතනයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබුනු අතර ඒ අනුව පරිපාලන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් අභ්‍යන්තර උසස්වීම් 51 ක පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු යොදන ලදී.

**අභ්‍යන්තර කාර්ය මණ්ඩල උසස් වීම්:**

| | |
|---|---|
| ව්‍යාපෘති නිළධාරි | 21 |
| ව්‍යාපෘති සහකාර | 02 |
| යතුරු ලේඛිකා 1 | 02 |

**නව පත්කිරීම්:**

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 02 |
| අධ්‍යක්ෂවරු | 08 |
| ව්‍යාපෘති නිළධාරි | 05 |
| සහකාර ව්‍යාපෘති නිළධාරි | 03 |
| නඩත්තු නිළධාරි | 01 |
| අභ්‍යන්තර විගණක | 01 |
| විගණක සහකාර | 01 |
| කාර්යාල ආධාරක | 05 |

**ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 16 දෙනෙකු විශ්‍රාම ගන්නා ලද අතර ඔවුන්ට හිමි පාරිතෝෂිත දීමනා ඔවුන් විශ්‍රාම ලැබූ දිනම ලබා දීමට කටයුතු යොදන ලදි.**

| | |
|---|---|
| සහකාර ව්‍යාපෘති නිළධාරි | 03 |
| අධ්‍යක්ෂ | 06 |
| ප්‍රධාන ව්‍යාපෘති නිළධාරින් | 07 |

- ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 26 දෙනෙකු හට වෘත්තිය සංවර්ධන පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් හා අධ්‍යයන නිවාඩු සපයන ලද අතර
- ආයතන කාර්ය මණ්ඩලයේ 67 දෙනෙකු සඳහා ඉංග්‍රීසි භාෂා සංවර්ධන වැඩ සටහනක් දියත් කරන ලදී.

8.2 **මුදල් දෙපාර්තමේන්තුව**

- ස්ථාවර වත්කම් ලේඛනය හා ඇගයීම් පටිපාටි සකස් කොට අවසන් කිරීම.
- 2011 වසරේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සකස් කිරීම.

## 8.3 ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

2011 වසරේ ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවට අදාළ ව පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කොට ඇත.

- ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණයේ කොටස් දෙකක් සඳහා සහ කාලයක් තිස්සේ අකුනු ආරක්ෂක පද්ධතියක් නොමැතිව තිබූ කෞතුකාගාර ගොඩනැඟිල්ලට අකුණු ආරක්ෂක සවිකිරිම.
- සහකාර අධ්‍යක්ෂ ජනරාල් කාමර 2ක් සහ දෘෂ්‍ය මාධ්‍ය ඒකකය සඳහා වායු සමීකරණ යන්ත්‍ර සැපයීම හා සවිකිරීම.
- මහරගම පරිශ්‍රය සඳහා අපත ජල පිරිසිදු කිරීමේ පද්ධතියක් හා කම්යුනේටරයක් සැපයීම හා සවිකිරීම.
- ආයතනයේ ඒකක 45 ක් සඳහා නව දුරකථන කට්ටල සැපයිම.
- මහරගම පරිශ්‍රයේ පොම්පාගාරයෙහි විදුලි සංඥා පුවරුව පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.
- කාර්යාලීය උපකරණ පුනරුත්ථාපනය කිරීම.
- මහරගම හා මීපේ පරිශ්‍රවල උද්‍යාන අලංකරණ කටයුතු සිදු කිරීම.
- ආයතනයේ ගබඩා හා සුළු සේවක නිල නිවාසවල වේ උවදුරු මර්ධනයට කටයුතු කිරීම.
- ආයතනයේ ගොඩනැගිලි 18ක්, වැසිකිලි 6ක, පොම්පාගාරය හා ගිණි උදුන් බට ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම.

## 8.4 මුද්‍රණ හා ප්‍රකාශන

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් 2011 වසරේ දී පහත සඳහන් ආයතනික ප්‍රකාශන මුද්‍රණය කරන ලදි.

- පොත්, පර්යේෂණ වාර සඟරා හා අනෙකුත් පර්යේෂණ ප්‍රකාශන 36ක්
- මොඩියුල 37ක්
- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ 24 ක්
- අනෙකුත් ප්‍රකාශන 110 ක්

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | සිර්/ජේ/එන්අයිර්/2011/එෆ්ඒ/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2012 ජුලි 31 දින |

අධ්‍යක්ෂ ජනරාල්,

ජාතික අධ්‍යාපන ආයතනය.

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික අධ්‍යාපන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1 ) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1 ) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7 ) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2012 ජුනි 20 දින අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එවා ඇත.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை | No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3 ) සහ (4 ) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම් ඉදිරිපත් කිරීම

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන පරීක්ෂණ වලදී හෙළිදරව් වූ ගිණුම්වල අඩුවෙන් දැක්වීම් රු.455,211 ක්ද, වැඩියෙන් දැක්වීම් රු.4,915,820 ක්ද පෙන්වා දීමෙන් පසු අවසාන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 **ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ ) පාසැල් වල ඇගයීම් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් වර්ෂ 3 කට වැඩි කාලයක සිට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අයවිය යුතුව ඇති රු.3,237,799 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ආ) සාමාන්‍ය අත්තිකාරම් යටතේ දක්වා තිබූ වර්ෂ 5 කට වැඩි රු.28,302 ක්ද, වර්ෂ 4 කට වැඩි රු.60,431 ක්ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටද පියවා ගැනීමට අපොහොසත්ව තවදුරටත් ඉදිරියට ගෙන එමින් පැවතුණි.

2.2.3 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | විස්තරය |
|---|---|---|
| (අ ) **ආයතන සංග්‍රහය** | | |
| xv පරිච්ඡේදයේ 3.1,4.2 හා 4.3 වගන්ති සහ xii පරිච්ඡේදයේ 14.2 වගන්තිය | (i ) | පර්වාස කාලයේ නිලධාරීන්ට විදේශ අධ්‍යයනයේ යෙදීමට වැටුප් සහිත නිවාඩු ලබාදීම සඳහා විධිවිධාන සැලසී නොතිබුණද, පර්වාස කාලයේ සිටි සහකාර ව්‍යාපෘති නිලධාරිනියකට 2007 සැප්තැම්බර් 01 සිට 2009 අගෝස්තු 31 දක්වා වැටුප් සහිත නිවාඩු අනුමත කර එම සම්පූර්ණ කාලය වෙනුවෙන් වැටුප් රු.650,160 ක් ගෙවා තිබුණි. නිවාඩු අනුමත කිරීමේදී ආයතනය විසින් ඇය වෙතින් විධිමත් ඇප බැඳුම්කරයකට අත්සන් කරගෙන නොතිබුණි. |
| xii පරිච්ඡේදයේ 23.1 හා 23.2 වගන්ති | (ii) | ඉහත නිලධාරිනිය විසින් 2009 සැප්තැම්බර් 01 සිට 2011 අගෝස්තු 31 දක්වා කාලය සඳහා විදේශ නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව නැවත විදේශගතවී තිබූ අතර එම කාලය වැටුප් රහිත නිවාඩු ලෙස සලකා ආයතනය කටයුතු කර තිබුණි. එම කාලයේ මාස 5 ක් සඳහා වැටුප්, සේවක අර්ථ සාධක හා සේවා නියුක්ති භාර අරමුදල් ලෙස ඇය වෙත රු.154,640 ක් ආයතනය විසින් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| v පරිච්ඡේදයේ 7 වගන්තිය | (iii) | නිවාඩු අනුමත කර ගැනීමෙන් තොරව සේවයට වාර්තා නොකළ ඉහත නිලධාරිනිය 2009 සැප්තැම්බර් 01 දින සිට සේවය හැර ගිය ලෙස සලකා ආයතනය කටයුතු කර නොතිබුණි. |

(ආ) <u>රජයේ මුදල් රෙගුලාසි</u>

| | |
|---|---|
| 371 (2 ) සහ (5 ) වගන්ති | තත්කාර්ය අතුරු අග්‍රිම යටතේ ලබාගන්නා අත්තිකාරම් අදාල කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත් ආයතනයේ සැපයුම් නිලධාරී වෙත අවස්ථා 8 කදී ලබාදුන් රු.226,517 ක අත්තිකාරම් පියවීම සඳහා මාස 5 සිට 8 දක්වා කාලයක් ලබාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ලබාගත් අත්තිකාරම් පියවීම 2012 පෙබරවාරි හා මාර්තු තෙක් ප්‍රමාද කර තිබුණි. |
| 394 (ආ) සහ (ඇ)<br>396 (ආ) සහ (ඇ) (i ) | 2011 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 6 ක් ඉක්මවා තිබුණද, බැංකුව වෙත ඉදිරිපත් නොවූ රු.478,865 ක් වටිනා චෙක්පත් 338 ක් අවලංගු කර ආදායමට බැර කර තිබූ අතර එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| 446 (2 ) | ආයතනය විසින් නඩත්තු කරනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉගෙනුම ලබන දරුවන්ගේ ආහාර වියදම් සඳහා 2011 වර්ෂය ආරම්භයේ රු.20,000 ක අග්‍රිමයක් මුදාහැර තිබූ අතර, මුල් අර්ධ වර්ෂයේ අවස්ථා 16 කදී රු.206,379 ක වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි. මුදල් රෙගුලාසි ප්‍රකාර මෙම ලැබීම් හා ගෙවීම් සටහන් කිරීම සඳහා ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| 770 හා 772 | මධ්‍යම ගබඩාවේ 2010 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ පරිදි ප්‍රයෝජනයට ගත නොහැකි රු.2,287,699 ක් වටිනා භාණ්ඩ වර්ග 42 ක් විකිණීමටත් රු.355,515 ක් වටිනා භාණ්ඩ වර්ග 50 ක් විනාශ කිරීමටත් සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් නිර්දේශ කර තිබුණද, 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කරන තෙක් එම නිර්දේශිත ක්‍රියා මාර්ග ඉටුකර නොතිබුණි. |

2.2.4 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ ) ජාතික අධ්‍යාපන ආයතනයේ නඩත්තු නිලධාරි (විදුලි ) තනතුර සඳහා බාහිර අයදුම්කරුවෙකු 2011 මැයි 15 දින සිට බඳවා ගෙන එම තනතුරේ අනුමත ආරම්භක වැටුප් පියවර වූ රු.26,970 ක් වෙනුවට වැටුප් පියවර 05 කින් ඉහල දමා රු.30,195 ක වැටුප් තලයේ පිහිටුවා තිබුණි. ආයතන සංග්‍රහයේ vii වැනි පරිච්ඡේදයේ 3 වගන්තියේ විධි විධාන ප්‍රකාර ඒ සඳහා ආයතන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබා නොතිබුණි.

(ආ) 2012 ජනවාරි 23 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව, 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකළ සමීක්ෂණ මණ්ඩල සභාපතිවරයාට රු.1,500 ක්ද, සමීක්ෂණ මණ්ඩල සාමාජිකයකුට රු.1,000 ක්ද, වශයෙන් දීමනා ගෙවීමට රු.293,000 ක් වැය කර තිබුණි. අදාල සමීක්ෂණ කටයුතු රාජකාරි වේලාව තුල සිදු කර තිබූ අතර, දීමනා හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි මේ සඳහා නිසි අනුමැතිය ලබාගත් බව විගණනයේදී තහවුරු නොවුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.41,078,116 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා ඊට ප්‍රතිරූපව ඌනතාවය රු.48,544,103 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 89,622,219 ක වර්ධනයක් ඇතිවීම සඳහා ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණේ මෙහෙයුම් ආදායම රු.74,472,104 කින් වැඩිවීම සහ සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය වියදම රු.12,098,309 කින්ද මෙහෙයුම් වියදම් රු.9,759,450 කින්ද අඩුවීමයි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්ය සාධනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ ) විවෘත පාසැල් ප්‍රාදේශීය මධ්‍යස්ථාන වැඩ සටහන යටතේ ප්‍රාදේශීය ඉගෙනුම් මධ්‍යස්ථාන වල පවත්වා ගෙන යනු ලබන පාඨමාලා සඳහා ගෘහ හා ප්‍රජා අධ්‍යාපන විෂයට අදාලව සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් සකස් කර තිබූ මොඩියුල 54 න් 34 ක් 2011 දෙසැම්බර් 31 දින තෙක් මුද්‍රණය කර නොතිබුණි. එම මොඩියුල ඉගෙනුම් ලාභීන් අතට පත් නොවීම තුලින් එම පාඨමාලාවන්ගෙන් අපේක්ෂිත අරමුණු නිසි පරිදි ඉටු වී නොතිබුණි.

(b ) (i ) 2007 සහ 2008 වර්ෂ වලදී මුද්‍රණය කර තිබූ පිරිවැය වටිනාකම රු.4,350,644 ක් වූ 6, 7, 10 සහ 11 ශ්‍රේණි වලට අයත් ගුරු මාර්ගෝපදේශ හා විෂය නිර්දේශ 64 කට අදාල පිටපත් 52921 ක්ද, පිරිවැය හඳුනාගත නොහැකි වූ ගුරු මාර්ගෝපදේශ හා විෂය නිර්දේශ 78 කට අදාල පිටපත් 35257 ක්ද පාසැල් වෙත බෙදා හැරීමකින් තොරව 2011 දෙසැම්බර් 31 වන විටත් සංචලනය නොවන තොග ලෙස පොත් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ii) පිරිවැය අනාවරණය කරගත නොහැකි වූ උසස් පෙළ විෂය නිර්දේශ පොත් 93 කට අදාල පිටපත් 70157 ක් 2011 දෙසැම්බර් 31 දිනට ගුරුවරුන් වෙත බෙදා නොහැර පොත් ගබඩාව තුල ඉතිරි තොග ලෙස පැවතුණි. එම පොත් වල පිරිවැය ගණනය කර 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් කර නොතිබුණි.

(iii) පාසැල් වලට නොමිලේ බෙදා හැරමට නියමිතව 2009 වර්ෂයේදී මුද්‍රණය කරන ලද 3, 4, 5 ශ්‍රේණි සඳහා වූ ඉංග්‍රීසි කතන්දර පොත් වර්ග 20 කට අදාල පිටපත් 108381 ක් පාසැල් වෙත බෙදා නොහැර ඉතිරි තොග ලෙස 2011 දෙසැම්බර් 31 දිනට ද ගබඩාව තුල පැවතුණි. මේ සඳහා දරන ලද පිරිවැය විගණනයට අනාවරණය නොවුණි.

4.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ ) (i ) ආයතනයේ ඉන්වෙන්ටර් හා පාරිභෝජන භාණ්ඩ තොග තත්ත්වය යාවත්කාලීන කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට 2010 වර්ෂයේදී පත් කළ කමිටු වාර්තාවේ ඇතුලත් සෙමින් නිකුත් වන රු.3,180,745 ක් වටිනා තොග අයිතම 32 ක ඒකක 24691 ක් නිකුත් වීමකින් තොරව වර්ෂ 5 - 10 ක කාලයක් ගබඩාවේ රඳවා තිබෙන අතර වර්ෂ 10 කට වඩා පැරණි රු.186,590 ක් වටිනා තොගයක් ද 2011 දෙසැම්බර් 31 වන විට තවදුරටත් ගබඩාවේ රඳවා තිබුණි.

(ii) කමිටු වාර්තාව ඉදිරිපත් කර වර්ෂ 1 ක් ඉක්මවා තිබුණද එම වාර්තාවේ සඳහන් කර තිබූ රු.441,380 ක් වටිනා යල් පැනගිය භාණ්ඩ අයිතම 42 ක් අපහරණය කිරීමට කටයුතු නොකර 2011 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ 2009 මැයි 18 දිනැති අංක : 2009/16 චක්‍රලේඛය අනුව, 2009 අගෝස්තු සිට ආරම්භ වන අ.පො.ස. (උසස් පෙළ ) නව විෂය නිර්දේශයේ විෂයයන් 3 කට අදාල ඉංග්‍රීසි මාධ්‍යය ගුරු මාර්ගෝපදේශ සහ විෂයයන් 2 කට අදාල දෙමළ මාධ්‍යය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ඇතුළත් සංයුක්ත තැටි සකස් කර මුද්‍රණය සඳහා 2011 දෙසැම්බර් 31 දින වන විටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාරදී නොතිබුණි.

(ඇ) දිගු කලක සිට මධ්‍යම ගබඩාවේ ගබඩා කර තිබෙන පැරණි ටයර් 496 ක් හා ටියුබ් 105 ක් අපහරණය කිරීමට 2011 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබූ අතර ඒ තුලින් ගබඩා පිරිවැය අවම කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්හිදී මේ පිළිබඳ හෙළිදරව් කර ඇතත්, මෙතෙක් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) පාරිභෝජන භාණ්ඩ අවශ්‍යතාවය අනුව ඇනවුම් කර කෙටි කාලයකින් භාවිතය සඳහා ආපසු නිකුත් කිරීමේ ක්‍රම වේදයක් අනුගමනය නොකර ද්‍රව්‍ය අයිතම 11 ක අධි තොග පවත්වා ගෙන ගොස් තිබුණි. මෙම තොගයෙන් වර්ෂ 10 කට වඩා පැරණි වී තිබූ රු.28,842 ක් වටිනා දුඹුරු කඩදාසි (brown paper ) ඒකක 19109 ක තොගයක් 2011 දෙසැම්බර් 31 දින වන විට යල් පැනීම් තත්ත්වයට පත්වී තිබුණි.

5. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

5.1 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

ආයතනය විසින් වර්ෂය තුලදී රු.50,275,852 ක ප්‍රාග්ධන වත්කම් මිලදී ගෙන තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය හා 2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 හි විධි විධාන පරිදි සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.2 <u>අයවැය ලේඛනමය පාලනය</u>

2011 වර්ෂයේ අයවැයගත වියදම් තථ්‍ය දත්තයන් හා සැසඳීමේදී 18 % සිට 56 % දක්වා ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

6. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. ඊට අමතරව පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි තවදුරටත් අවධානය යොමු කළ යුතුය.

(අ) ගබඩා පාලනය
(ආ) පොත් හා ග්‍රන්ථ මුද්‍රණය
(ඇ) අයවැය පාලනය
(ඈ) අධ්‍යයනය සඳහා විදේශ ගමන්
(ඉ) විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම

(එච්.ඒ.එස්.සමරවීර )
විගණකාධිපති.

# මූල්‍ය වාර්තාවලට සටහන්

## 1. හඳුනාගත් ගිණුම් ප්‍රතිපත්ති

### 1.1 පොදු :

ප්‍රකාශයට පත්කරන ලද ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල හා තත්ත්වය පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ප්‍රතිපත්තිවලට අනුකූලව ඓතිහාසික පිරිවැය මත ගණනය කරනු ලබන අතර ඒවා මින් පෙර භාවිතා කළ ප්‍රතිපත්ති හා අනුරූප වෙයි.

1.2 සියළුම විදේශීය විනිමය ගණුදෙනු ඒවා සිදුවන අවස්ථාවේ පැවැති විනිමය අනුපාත මත පරිවර්තනය කරනු ලැබේ.

### 1.3 වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම

#### 1.3.1 ණය ගැතියෝ හා අනිකුත් ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ ගණනය කර ඇත්තේ එහි අන්තර්ගත උපලබ්ධි අගය මත ය. අයකර ගැනීමට නොහැකි එනම් අනුමාන කරන ප්‍රමාණයන් ගණනය කර ඇත්තේ වර්ෂය අවසානයේ ලැබිය යුතු වටිනාකම් පදනම් කරගෙන ය.

#### 1.3.2 දේපල පිරියත සහ උපකරණ සහ ක්ෂයවීම්

ස්පෘශ්‍ය වත්කම් පෙන්වා ඇත්තේ පිරිවැය වටිනාකමින් සමුච්චිත අගය අඩු කිරීමෙනි. වත්කම් අත්පත් කරගන්නා අවස්ථාවේ අත්පත් කර ගැනීමට විශේෂිත වූ වියදම් පිරිවැය තුළ අඩංගු වේ. ක්ෂයවීම් ප්‍රමාණය ආදායම් ගිණුමෙන් කපා හැර ඇත්තේ පහත විස්තර වන අනුප්‍රමාණයන්ට අනුව එනම් හීනවන වාරික ක්‍රමය මත වත්කම්වල ප්‍රමාණවත් ආයු කාලය සැලකිල්ලට ගනිමිණි.

**දේපල පිරියත හා උපකරණ වර්ෂය තුළ ක්ෂය කර ඇත්තේ පහත සඳහන් පරිදි ය.**

| | |
|---|---|
| කාර්යාලීය ලී බඩු හා උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 33 1/3% |
| පුස්තකාල පොත් හා සඟරා | 10% |
| යතුරුපැදි හා පාපැදි | 20% |
| යන්ත්‍ර හා පිරියත | 10% |
| මෝටර් රථවාහන | 20% |
| ගොඩනැගිලි | 5% |
| ඡායා පිටපත් යන්ත්‍ර | 10% |

### 1.3.3 තොග

තොග පිරිවැය ගණනය කරනු ලබන්නේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය.

### 1.3.4 මුදල් හා මුදල් හා සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන දෑ වශයෙන් ඇතුලත් වන්නේ බැංකුවේ හා අත ඉතිරි මුදල් ය.

### 1.3.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය මත පිළියෙල කර ඇත. (Indirect Method)

## 1.4 ප්‍රදාන ගිණුම්ගත කිරීම

ආයතනයේ වියදම් ප්‍රතිපූරණය සඳහා ලද ප්‍රදාන ආදායම් ප්‍රකාශයේ දී විධිමත් පදනමක් මත වියදම් දැරූ කාල පරිච්ඡේදය සඳහා වූ ආදායම ලෙස සලකනු ලැබේ.

ආයතනයේ ප්‍රාග්ධන වියදම් ප්‍රතිපූර්ණය සඳහා ලැබෙන ප්‍රදාන ප්‍රාග්ධනගත කරනු ලබන අතර එය විධිමත් පදනමක් මත අදාළ වත්කමෙහි ඵලදායී ජීවිත කාලය පුරා ආදායමක් ලෙස සලකනු ලැබේ.

## 1.5 සේවක ප්‍රතිලාභ

### 1.5.1 සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම

සේවා කාලය වසර පහ සම්පූර්ණ කළ සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් කර ඇත්තේ 1983 අංක 12 දරණ විශ්‍රාම ප්‍රතිලාභ පනත යටතේ ය.

මෙම බැරකම සඳහා පිටත අරමුදල් ආයෝජනය කර නොමැති අතර පිරිවැය සත්‍ය වශයෙන් ගණනය කර නොමැත.

### 1.5.2 නිර්වචිත දායක සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය සඳහා වන බැඳීම් ආදායම් ප්‍රකාශයේ දී දරණ ලද වියදමක් ලෙස දක්වා ඇත.

## 1.6 ජංගම බැරකම්

ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත ගෙවීමට සිදුවිය හැකි හා ඉල්ලුම් කරනු ලැබිය හැකි දේ ජංගම බැරකම් වේ. ශේෂ පත්‍ර දිනයේ සිට වසරකට හෝ ඊට වඩා වැඩි කාලයක දී ගෙවීමට සිදුවිය හැකි දෑ ජංගම නොවන බැරකම් වේ.

## 1.7 ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සිද්ධීන්

ශේෂ පත්‍ර දිනට පසුව සිදු වූ ප්‍රමාණාත්මකව සිදුවීම් සලකා බලනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හි දී ගිණුම්වල සුදුසු ගැලපුම් කර ඇත.

## 1.8 ආදායම් හා වියදම්

### 1.8.1 ආදායම් හඳුනාගැනීම

i. පුනරාවර්තන සඳහා රජයේ ප්‍රදාන මුදල් පදනම යටතේ ආදායම් හා වියදම් වාර්තාවල හඳුනාගෙන ඇත. ප්‍රකාශන අලෙවිය, ලැබූ නේවාසිකාගාර ගාස්තු, පාඨමාලා ගාස්තු සහ විභාග ගාස්තු සහ විවිධ ආදායම් ආදිය ශිෂ්‍යයන්ගෙන් ලැබූ ගාස්තු ශිෂ්‍යන්ගෙන් ලැබූ ආදායම් ලැබීම් මත පමණක් ආදායම ලෙස සලකා ඇත.

ii. විභාග සම්මන්ත්‍රණ පාඨමාලා මත වූ අතිරික්ත/ඌනතාවය සහ අධ්‍යාපන හා සාමාජික ක්‍රියාකාරකම් නිම වූ වර්ෂයේ ආදායම් ගිණුම්වලට ගනු ලැබේ.

### 1.8.2 වියදම්

i. ආයතනය පැවැත්ම සහ ප්‍රාග්ධන වත්කම් ක්‍රියාකාරිත්වයේ පවත්වා ගැනීම සඳහා සියළු වියදම් වර්ෂයේ අතිරික්තය ඌනතාවය ලබා ගැනීමේ දී අදාළ ආදායමට ගලපා ඇත.

ii. ආයතනයේ ඉපයීමේ ධාරිතාවය පවත්වාගෙන යාමට හෝ වැඩි කිරීමේලා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ දීර්ඝ කිරීම් හෝ වැඩිදියුණු කිරීම සඳහා දරණ ලද සියළු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

## 1.9 අසම්භාව්‍යන්

පහත සඳහන් නඩු උසාවියේ පවතින බැවින් වගකීම් වටිනාකම ස්ථිර නොවන බැවින් ඒ සඳහා වෙන් කිරීම් කළ නොහැක.

### 1.9.1

| | | |
|---|---|---|
| 1. | අංක 780/09/m/මුදල් | රු. 2,237,337 |
| 2. | අංක 4801/05/මුදල් | රු. 2,947,755 |
| 3. | ඒ.පී.එස්.එස්.පතිරණ මයා | රු. 4,056,527 |
| 4. | එස්.එම්.එම්.සේනානායක මයා | රු. 876,235 |

**1.9.2 පහත සඳහන් පුද්ගලයින් වෙනුවෙන් නීති ක්‍රියාමාර්ග ගැනීම සිදුවෙමින් පවතී.**

| | | |
|---|---|---|
| 1. | කේ.ඩබ්.පී.ඒ.වීරවර්ධන මිය | රු. 202,728 |
| 2. | එම්. තංගවේල් මයා | රු. 276,958 |
| 3. | ඒ.ඩී.කේ. විජේවර්ධණ මිය | රු. 213,120 |
| 4. | එස්.ආර්.ගජධීර මිය | රු. 362,250 |

**1.9.3** තොග සමීක්ෂණයේදී හිඟයක් ලෙස හඳුනාගත් රු. 202,189.60ක් වටිනා වත්කම් සඳහා පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතී.

**2.1** ජාතික අධ්‍යාපන ආයතනය ආරම්භයේ සිටම ප්‍රාග්ධන අරමුදල් සඳහා වූ රජයේ ප්‍රදාන වලින් අඩුකළ යුතු ස්ථාවර වත්කම් සඳහා වෙන්කරන ලද ක්ෂය වෙන් කිරීම, අවශ්‍ය ගිණුම්වල ප්‍රාග්ධන අරමුදල් තුළ සංශෝධනය කර නොමැත.

එම නිසා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 24 අනුව 2011 වර්ෂයේ මෙම මුදල අවශ්‍ය ගිණුම්වල ගැලපුම් කර ඇත. මේ අනුව ප්‍රතිඵල පහත පරිදි වේ.

| | | <u>ගැලපුම් කිරීමට පෙර</u> | <u>ගැලපුම් කිරීමෙන් පසු</u> |
|---|---|---|---|
| 1. | වර්ෂය සඳහා ඌණතාවය/අතිරික්තය | (27,711,565.95) | 41,078,115.58 |
| 2. | ප්‍රාග්ධන අරමුදල් සහ සංචිත | 1,470,378,813.37 | 952,009,253.23 |
| 3. | සමුච්චිත අරමුදල | (883,806,055.53) | (366,010,719.66) |

# ජාතික අධ්‍යාපන ආයතනය

## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

| | සටහන් | 2011 රු. ශත | 2010 රු. ශත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපල යන්ත්‍රසූත්‍ර හා පිරියත | 1 | 731,455,431.10 | 722,494,439.19 |
| එකතු කළා - කෙරිගෙන යන වැඩ | 1-A | 6,652,325.99 | 4,241,444.75 |
| | | 738,107,757.09 | 726,735,883.94 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය/පවතින බඩු | 2,2A | 21,735,420.14 | 24,151,139.62 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 3,3A | 69,625,866.53 | 69,834,495.80 |
| කලින් ගෙවුම් | 4 | 908,202.92 | 117,691.00 |
| කෙටි කාලීන ආයෝජන | 5 | 120,000,000.00 | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 5A | 61,507,669.44 | 114,878,205.94 |
| | | 273,777,159.03 | 208,981,532.36 |
| මුළු වත්කම් | | 1,011,884,916.12 | 935,717,416.30 |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| උපචිත වියදම් | 6 | 26,676,630.10 | 23,807,938.30 |
| කලින් ලැබුණු පාඨමාලා ගාස්තු | 7 | 38,325,000.00 | 17,000,000.00 |
| | | 65,001,630.10 | 40,807,938.30 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 8 | 71,720,527.95 | 74,765,494.47 |
| මුළු වගකීම් | | 136,722,158.05 | 115,573,432.77 |
| ශුද්ධ වත්කම්වල එකතුව | | 875,162,758.07 | 820,143,983.53 |
| **ශුද්ධ වත්කම්** | | | |
| සමුච්ත අරමුදල | 9 | (366,010,719.66) | (868,177,698.26) |
| ප්‍රාග්ධන සංචිත | 10 | 952,009,253.23 | 1,411,079,790.03 |
| ණය අරමුදල | 11 | 55,377,949.50 | 52,918,954.29 |
| ප්‍රත්‍යා ගණන සංචිත අරමුදල | 12 | 233,786,275.00 | 224,322,937.47 |
| මුළු ශුද්ධ වත්කම් | | 875,162,758.07 | 820,143,983.53 |

මූල්‍ය වාර්තාවට අදාළ ගණකාධිකරණ ප්‍රමිත හා සටහන් පිටු අංක 03 සිට 05 දක්වා අදාළ වේ.

නිවැරදි බවට නිර්දේශ කළේ :

එස්. ගාල්ලගේ
අධ්‍යක්ෂ (මුදල්)

අනුමත කළේ :

මහාචාර්ය ඩබ්.එම්.අබේරත්න බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

2012 අප්‍රේල් 27
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

## ජාතික අධ්‍යාපන ආයතනය

## මූල්‍ය කාර්යසාධන විස්තරය

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. ශත | රු. ශත |
| **මෙහෙයුම් ආදායම්** | | | |
| රජයේ සහ විදේශ වලින් ලත් පුනරාවර්තන ආදායම් | 14 | 269,258,193.05 | 313,046,171.31 |
| අනෙකුත් ආදායම් | 13/(15-20) | 252,097,124.24 | 143,268,130.28 |
| **මුළු ආදායම** | | **521,355,317.29** | **456,314,301.59** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 21 | 200,200,769.42 | 197,430,700.63 |
| ගමන් වියදම් | 23 | 4,534,766.37 | 9,710,818.77 |
| සැපයීම් සහ පාරිභෝජන අවශ්‍යතා | 24 | 18,128,000.41 | 30,226,309.57 |
| නඩත්තු වියදම් | 25 | 24,240,440.57 | 14,081,005.31 |
| ගිවිසුම්ගත සේවා | 26 | 151,704,770.83 | 150,080,951.85 |
| තැන්පත් වියදම් | 26-1 | 25,606,817.52 | 33,707,341.80 |
| ක්ෂයවීම් හා වෙන් කිරීමේ වියදම් | 27 | 44,401,802.13 | 48,551,992.20 |
| මෙහෙයුම් වියදම් | 28 | 11,069,834.46 | 20,829,284.01 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **479,887,201.71** | **504,618,404.14** |
| අතිරික්තය/(ඌනතාවය) මෙහෙයුම් ක්‍රියාවලිය මූල්‍ය පිරිවැයට පෙර | | 41,468,115.58 | (48,304,102.55) |
| මූල්‍ය පිරිවැය | 29 | (390,000.00) | (240,000.00) |
| **කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)** | | **41,078,115.58** | **(48,544,102.55)** |

මූල්‍ය වාර්තාවන්ට අදාළ ගණකාධිකරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු අංක 03 සිට 05 දක්වා අදාළ වේ.

නිවැරදි බවට නිර්දේශ කළේ :

එස්. ගාල්ලගේ
අධ්‍යක්ෂ (මුදල්)

අනුමත කළේ :

මහාචාර්ය ඩබ්.එම්.අබේරත්න බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

2012 අප්‍රේල් 27
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

## ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2011<br>රු. ශත | 2010<br>රු. ශත |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| (අතිරික්තය/ඌනතාවය) සාමාන්‍ය ක්‍රියාකාරකම් | 41,078,116.00 | (48,544,102.00) |
| **ගැලපීම්** | | |
| මූල්‍ය නොවන ක්‍රියාකාරකම් | | |
| ක්ෂයවීම් | 48,679,436.00 | 46,006,322.00 |
| සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම | 6,895,794.00 | 1,774,929.00 |
| අනිකුත් ගැලපීම් | (49,516,362.00) | 5,985,401.00 |
| **ක්‍රියාකාරී ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්** | **47,136,984.00** | **5,222,550.00** |
| තොගය වැඩිවීම්/(අඩුවීම්) | 2,415,719.00 | (15,233,833.00) |
| ලැබිය යුතු දෑවල (වැඩිවීම්)/අඩුවීම් | (581,883.00) | (5,557,744.00) |
| අනෙකුත් ජංගම වත්කම්වල (වැඩිවීම්/අඩුවීම් | (120,000,000.00) | |
| ගෙවිය යුතු දෑ වල වැඩිවීම්/(අඩුවීම්) | 24,193,692.00 | (18,353,663.00) |
| **ක්‍රියාකාර ප්‍රාග්ධනයෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(93,972,472.00)** | **(39,145,240.00)** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් | (46,835,488.00) | (33,922,690.00) |
| සේවක පාරිතෝෂික සඳහා ගෙවීම් පිරිවැය | (9,968,426.00) | (6,142,350.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල** | **(56,803,914.00)** | **(40,065,040.00)** |
| **ආයෝජිත ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රමාණය** | | |
| දේපල යන්ත්‍රසූත්‍ර හා පිරියත එකතු කිරීම් | (58,324,640.00) | (17,113,492.00) |
| **ආයෝජිත ක්‍රියාකාරකම් සඳහා යොදන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(58,324,640.00)** | **(17,113,492.00)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන හා පරිත්‍යාග | 59,299,023.00 | 24,500,000.00 |
| ණය අරමුදල | 2,458,995.00 | 2,252,087.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදූ ශුද්ධ මුදල** | **61,758,018.00** | **26,752,087.00** |
| ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) මුදල් හා මුදල් හා සමාන දෑ | (53,370,536.00) | (30,426,446.00) |
| මුදල් හා මුදල් හා සමාන දෑ (වර්ෂ ආරම්භය) | 114,878,205.00 | 145,304,651.00 |
| **මුදල් හා මුදල් හා සමාන දෑ (වර්ෂ අවසානයේ)** | **61,507,669.00** | **114,878,205.00** |